# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.02.12 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ තිස් පස්වන (35) සභා වාරය 2021.02.12 වන දින පෙ.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී. චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

ඉන් අනතුරුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

නැත

## 03.<u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

I. මොනරාගල වැදිකුඹුර, බෝහිටිය, අඹගස්හෙළ පදිංචි ඒ.එච්.වාලිනා හා අයි.පී.කවඩියා යන අඹුසැමි යුවල වැසිකිළියක්ද පවා නොමැතිව ඉතා දුෂ්කර ජීවිතයක් ගත කරන දෙපලක් වන අතර, ඔවුන් වෙත වැසිකිළි ආධාරයක් ලබා දෙන ලෙස ග්‍රාම නිලධාරි නිර්දේශයක් ද සහිතව ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ශ්‍රේෂ්ඨ සොයුරිය විසින් මවෙතින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කර සිටින ලදි.

සභා අරමුදලින් ඍජුව ම මේ සඳහා අධාර ලබාදිය නොහැකි බැවින්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට මෙය ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරිමට පියවර ගන්නා බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

මේ සඳහා මහ සභාවේ එකඟතාවය ද පළ කර සිටින ලදී.

II. මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම්/ගොඩනැගිලි වෙන්දේසි කිරිම සඳහා දින 14 කට පෙර ප්‍රාදේශිය සභාව දැනුවත් කර අනුමැතිය සහිත බලපත්‍රයක් ලබා ගත යුතු වුවත්, එසේ දින 14 ක් නොමැතිව ඊට වඩා අඩු කෙටි දින ගණනක් තුළ වෙන්දේසි කිරිමට බලපත්‍ර ඉල්ලුම් කරන්නන් ඉදිරිපත් වන අතර, එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ යුතු ද නොඑසේ නම් ඊට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මහ සභාවේ තීරණයක් ලබා දෙන ලෙස ආදායම් පරීක්ෂක ආර්.එම්.ආරියරත්න මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී ප්‍රාදේශිය සභා නීති රීති රෙගුලාසියන්ට යටත්ව මෙම වෙන්දේසි සඳහා බලපත්‍ර ලබා ගැනීම වෙන්දේසිය පැවැත්වෙන දිනට දින 14 කට පෙර ප්‍රාදේශිය සභාව දැනුවත් කර අනුමැතිය සහිතව සිදු විය යුතු අනිවාර්ය කටයුත්තක් වන අතර, දින 14 ට අඩු කාලයකදී ඉහත දේපල වෙන්දේසි කිරිම සඳහා අවසර ලබා දීම සිදු නොකළ යුතු බවත්, එසේ අවසර ලබා දීම තුළ අතරමැදි පාර්ශවයන් වාසි ලබා ගැනීමට කටයුතු කරන අතර ඉඩම් හිමියාට සාධාරණ මිලක් නොලැබෙන බව ගරු සභාවේ සාකච්ඡා වූ අතර. මෙම වෙන්දේසි සඳහා බලපත්‍ර ලබා ගැනීම වෙන්දේසිය පැවැත්වෙන දිනට දින 14 කට පෙර සිදු විය යුතු අනිවාර්ය කටයුත්තක් බව ගරු සභාපතිතුමා ඇතුළුව මහ සභාවේ සියළු දෙනාගේ ම පොදු එකඟතාවය විය.

III. මොනරාගල, සිරිගල, ජයසූරිය මාවත හි පදිංචිකරුවන් විසින් එම මාර්ගය කොන්ක්‍රිට් කිරිමේදී එක් පසෙකින් ඉදිකර තිබූ බෝක්කුවක් ඉරිතලා පළුදු වී ගොස් ඇති අතර, පසුගිය දිනවල පැවති වර්ෂාව හේතුවෙන් එම ස්ථානයේ පස සෝදා ගොස් අසල කාණුව අඩි 05 ක් පමණ කැඩී යාම නිසා බෝක්කුවේ පැති බැම්ම සෝදා ගොස් කොටසක් කඩා වැටී ඉතා අනතුරුදායක තත්ත්වයකට පත්වීම නිසා මෙම බෝක්කුව සම්පූර්ණයෙන් කඩා වැටීමේ අවදානමක් ඇති බැවින්, සිදු විය හැකි විශාල අනතුරකට පෙර මෙම බෝක්කුව හා කාණුවේ අළුත්වැඩියා කටයුතු සිදු කර දෙන ලෙසට ප්‍රදේශවාසීන් විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති බවට ගරු සභාපතිතුමා මහ සභාවට ඉදිරිපත් කර සිටින ලදී.

මේ සම්බන්ධව කාර්මික නිලධාරි යොදවා පරීක්ෂා කරවා අදාළ වාර්තාවක් සහ අදාළ ඇස්තමේන්තුවක් ද සකස් කිරීමෙන් අනතුරුව ලබන මස සභා වාරයට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ඇතුළුව මහ සභාවේ සියළු දෙනාගේ පොදු එකඟතාවය විය.

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

නැත

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

### 5.1. <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**යෝජනා අංක 01**

2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක මුදලක් අඩු කර සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

සභාව සතු දේපලක් ටෙන්ඩර් කිරීමේදී (විශේෂයෙන්ම පොළ, පොදු වැසිකිළිය වැනි ස්ථාන) ඒ පිළිබඳව මනා අධ්‍යනයක් සිදු කර සමස්ථ කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව අප විසින් ලංසු මුදලක් තීරණය කළ යුතු බවත්, මෙම ලංසු මුදල පදනම් කර ගනිමින් ටෙන්ඩර් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුවන් විසින් (මෙම මුදල වැඩිකර ඉතා විශාල මුදලකින්) ටෙන්ඩර් ලබා ගැනීමට කටයුතු කරන අතර, අප විසින් කරනු ලබන්නේ ඉන් ඉදිරි වර්ෂයේදීත් අදාළ ටෙන්ඩරය ලබා ගත් අය විසින් ඉදිරිපත් කරන ලංසු මුදල හෝ ඊට වැඩිකරන ලද යම් ප්‍රතිශතයකින් පසුව ලැබෙන ලංසු මුදල ටෙන්ඩර් කිරීමට පදනම් කර ගන්නා අතර, දිගින් දිගට ම මෙය සිදු කිරීම මත විවිධාකාර ගැටළු සහගත තත්ත්වයන් ඇති වේ. එම තත්ත්වය වෙළෙන්දාටත් පාරිභෝගිකයාටත් වක්‍රාකාරයෙන් බලපාන බැවින්, මින් ඉදිරියට එම තත්ත්වය නිවැරදි කර ගත යුතු බැවින්, ඒ ආකාරයෙන් ටෙන්ඩර් කිරීම සිදු නොකර අප විසින් නිශ්චිතව හඳුනා ගත් තොරතුරු පදනම් කර ගනිමින් ලංසු මුදල තීරණය

කළ යුතු අතර, ඒ ආකාරයෙන් එම ලංසු මුදලට අනුව ඉදිරි ටෙන්ඩර් කටයුතු සිදු කිරිම කළ යුතු බවට ගරු සභාපතිතුමා මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය මත මෙම ඉල්ලීමට අදාළ කරුණු කාරණාවල සාධාරණත්වයක් පවතින නිසා මෙම සති පොළ බදුගත් අය විසින් ගෙවිමට නියමිත මාසික කුළී මුදලෙන් 20%ක් අඩු කර අය කර ගැනීමට කටයුතු කිරිම සුදුසු බවත්, එය 2021 ජනවාරි මස සිට ම 20% අඩු කර අය කිරිම සුදුසු බවත්, පොළේ වෙලදාම් කටයුතු හා පාරිභෝගිකයින්ගේ පැමිණීම යථා තත්ත්වයට පත් වන තුරු බදුකරු වෙත නැවත දැනුම් දෙනතුරු මාසිකව අය කරන බදු මුදල් මෙසේ අඩු කර අය කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලද අතර, ඉදිරි වර්ෂයේ සිට සභාව සතු දේපල ටෙන්ඩර් මගින් බදු දීමේදී ගරු සභාපතිතුමා පැහැදිලි කළ ආකාරයට ලංසු මුදල තීරණය කිරිමේදී අදාළ දේපල සම්බන්ධව හොඳින් අධ්‍යනය කර අදාළ නිශ්චිත තොරතුරු පදනම් කර ගනිමින් තීරණය කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව, දැනට මොනරාගල කොට්ඨාසයේ දඩාවතේ යන සුනඛයින් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, ඊට හේතුව වන්නේ පැටවුන් ලැබීම වැලැක්වීම සඳහා ලබා දෙනු ලබන එන්නත් දැනට වසර ගණනාවක සිට ලබාදී නොමැති බව වන අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට වර්ෂයක් සඳහා එන්නත් කුප්පි 750 ක් පමණ අවශ්‍ය බැවින්, අප වෙතින් ඉල්ලීම් කර ඇති එන්නත් කුප්පි 750 ක් ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ වන විට බල ප්‍රදේශයේ නිදැල්ලේ හැසිරෙන සුනඛයින්ගේ වැඩිවීමක් ඇති බව අප කවුරුත් දන්නා කරුණක් වන අතර, එයින් සිදු විය හැකි අනතුරුදායක තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ගෙන ඇති මෙම තීරණය සඳහා ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි සහයෝගය දැක්විය යුතු බැවින් මෙම එන්නත් කුප්පි ලබාදිම සුදුසු වන අතර, මෙම එන්නත් කුප්පියක වටිනාකම හෝ ඊට අදාළව ක්‍රියාත්මක විය යුතු යාන්ත්‍රණය කුමන ආකාරයකින් සිදු කළ යුතු ද යන්න සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ඔවුනට අවශ්‍ය ආකාරයට අදාළ එන්නත් කුප්පි 750 ලබාදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 03**

දෙහිවල, කළුබෝවිල, සුජාතා මාවත, අංක 27/ඒ හි පදිංචි එච්.එච්.එස්.පී.සුරංග ද සිල්වා මහතා විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව, මොනරාගල කුමාරදොල පාර වම, පොළ පිවිසුම් මාර්ගයේ ඔහුට අයත්ව තිබූ වරිපනම් අංක 67/45, 67/46, 67/48,67/49, 67/50, 67/51, 67/52, 67/53, 67/54, 67/55 දරණ දේපල 2019 වර්ෂයේ සභාව විසින් කඩා ඉවත් කර ඇති බැවින්, එම දේපලවලට අදාළ මෙම වරිපනම් අංක ලේඛනවලින් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉහත වරිපනම් අංක යටතේ පැවති කඩා ඉවත් කරන ලද කඩ කාමර සඳහා ලේඛනවල පවත්වා ගෙන ගිය මෙම වරිපනම් අංක ආදායම් පරීක්ෂක මහතාගේ නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව එම දේපල කඩා ඉවත් කළ දින සිට අදාළ වරිපනම් අංක හා ඊට අදාළ ගාස්තු ලේඛනවලින් ඉවත් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 04**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා එම වාර්තාවට අදාළව එහි ඇතුළත් අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම, විනාශ කිරීම සහ වෙන්දේසි කළ යුතු භාණ්ඩ තක්සේරු කිරීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන් පත් කර ගැනීම හා 2020 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

| | | | |
|---|---|---|---|
| I. | උපාලි හේරත් මයා | - | විමර්ශන නිලධාරි |
| II. | සුනිල් අරංගල මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| III. | ඩබ්.එම්.සරත් කුමාර වනසිංහ මයා | - | කාර්මික නිලධාරි |
| IV. | කේ.එම්.ලොකුබණ්ඩා මයා | - | සංවර්ධන නිලධාරි |
| V. | කේ.එම්.ප්‍රභාත් චින්තක මයා | - | කළමනාකරණ සේවා නිලධාරි |
| VI. | කේ.එම්.එන්.ප්‍රියදර්ශණී මිය | - | සංවර්ධන නිලධාරි |

මෙම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2020 වර්ෂයට අදාළව සකස් කර ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවත්, මෙම වාර්තාවට අනුව අබිලි භාණ්ඩ වෙන්දේසි කිරිමටත්, ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරිම සඳහාත්, වෙන්දේසි කළ යුතු භාණ්ඩ තක්සේරු කිරිම සඳහා ත් තෝරා ගෙන ඇති ඉහත නම් සඳහන් නිලධාරින් ඇතුළු කණ්ඩායම යොදවා ගනිමින් එම සියළු කටයුතු විධිමත් පරිදි සිදු කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 05**

මොනරාගල , මදුරුකැටිය, අංක 05 හි පදිංචි ටී.ඩී.නිර්මලා දමයන්ති යන අය විසින් අප ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය දිනකට රු.6000/= ක මුදලකටත්, මොනරාගල, සිරිවිජයපුර හි පදිංචි ටී.වී.තිවංක පෙරේරා යන අය එම වැසිකිළියම දිනකට රු.7000/= ක මුදලකටත් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. එම ඉල්ලීම් අනුව මහ සභාවේ සභා අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නව බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය තෙවතාවක් ටෙන්ඩර් කළ ද අයඳුම්කරුවන් ඉදිරිපත් නොවීම නිසා දිනකට රු.7000/= ක මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවීමට යටත්ව කුළි පදනම මත මෙම දේපල පවත්වා ගෙන යාම සඳහා ඉල්ලුම් කර ඇති බදුකරු හට වැසිකිළියේ පිරිසිදු කිරිම් හා නඩත්තු කටයුතු(ජල, විදුලි බිල්පත් හැර) සිදු කර ගෙන යාමේ කොන්දේසි සහිතව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ලබාදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. ඔහු විසින් මෙම ඉල්ලීම අත්හරින්නේ නම් පමණක් එය තහවුරු කර ගැනීමකින් අනතුරුව දිනකට රු.6000/= ක් ලබාදීමේ හැකියාව ඇති අය වෙත ලබා දීම සුදුසු බවටද මහ සභාව තීරණය කරන ලදී.

**යෝජනා අංක 06**

කොරෝනා වසංගතය හේතුවෙන් ජනතාවට සහන ලබාදීමේදී ප්‍රාදේශීය සභාවෙන් ජලය ලබා ගන්නා පාරිභෝගිකයින් සඳහා 2020 මාර්තු, අප්‍රේල්, මැයි යන ජලය නොලැබුණ මාස තුන සඳහා ද, 2020 වර්ෂයේ නියඟය පැවති කාල වකවානුවේදී ජුනි, ජූලි හා අගෝස්තු යන ජලය නොලැබුණු මාස තුන සඳහා ද මාසික ජල ගාස්තු කපා හැරීම සුදුසු බවට 2020.07.21 දින පැවති විශේෂ මහ සභාවේත්, 2020.09.10 දින පැවති මහ සභාවේදීත් ඒකමතිකව සභා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව මෙම මාස 06 සඳහා කපා හැරීම සඳහා ඉදිරිපත් කර තිබූ සමස්ථ මුදල වශයෙන් රු.429,600.00 ක් වන අතර, එම සමස්ථ මුදලට අදාළ කාලවලදී ම තවත් රු. 7300.00 ක මුදලක් (දුටුගැමුණු පාර සඳහා රු.4800.00 ක් ද පොතුවිල් පාර සඳහා රු.2500.00 ක් ද වශයෙන්) එකතු විය යුතු බවට විෂය නිලධාරි විසින් දන්වා ඇති බැවින්, එම මුදල ද සමග සමස්ථය වන රු.436,900.00 ක මුදලක් මෙම මාස 06 සඳහා කපා හැරීමට සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කොරෝනා වසංගතය සහ නියඟය හේතුවෙන් ප්‍රාදේශීය සභාව මඟින් ජනතාවට සහන ලබාදීමේ වැඩකටයුතු වලදී ප්‍රාදේශීය සභා ජල මූලාශ්‍රයෙන් ජලය ලබා දෙන පාරිභෝගිකයින්ගෙන් මාසිකව අය කරනු ලබන ජල ගාස්තු අය නොකිරීම සුදුසු බවට මීට පෙර අවස්ථා දෙකකදී අනුමැතිය ලබා දී ඇති සභා තීරණයන්ට අනුව කටයුතු කිරීම සුදුසු බවත්, එසේ මාස 06 ක් සඳහා කපා හැරීමට නියමිත රු. 436,900.00 ක සමස්ථ මුදල එම පාරිභෝගිකයින්ගෙන් අය නොකර අදාළ ලේඛන වලින් කපා ඉවත් කිරීම සුදුසු බවත්, ගරු ආණ්ඩුකාර තුමන්ගේ අනුමැතියට යටත්ව එසේ කපාහැරීම සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොනරාගල මාගන්දනමුල්ල පට්ටියලන්ද පොදු සුසාන භූමිය මේ වන විට අනවසරයෙන් මිනිසුන් විසින් අල්ලා ගැනීමට කටයුතු කර ඇති බැවින්, එම ඉඩම නිරවුල් කර කම්බි වැටක් ඉදිකර ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටි අතර, මෙම භූමි පරිශ්‍රයේ විශාල කැළයක් පවතින අතර, කම්බි ගැසීමට පෙර එය ශුද්ධ පවිත්‍ර කළ යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදී ප්‍රදේශයේ මරණාධාර සමිතියේ සාමාජිකයින් විසින් මේ වන විටත් මෙහි කැළය කපා ශුද්ධ පවිත්‍ර කර ඇති බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා අදාළ වාර්තාවන්ට අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### යෝජනා අංක 02

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පහත සඳහන් මාර්ග මෝටර් ග්‍රේඩර් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

I. රත්නපිටිය දේවාල මාර්ගය

II. සිරි මයුරපුර 2 වන පටුමඟ
III. දෙහිවැල්ලන්ද මාර්ගය

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, විරෝධතාවයකින් තොරව එය සභා සම්මත විය.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, JCB යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය නිදහසේ පවතින වේලාවක මෙම මාර්ග මෝටර් ග්‍රේඩර් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සූරියගොල්ල මාර්ගයේ ප්‍රවේශ වන ස්ථානයේ මීටර් 400 ක් පමණ JCB යන්ත්‍රය යොදා සකස් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, JCB යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය නිදහසේ පවතින වේලාවක මෙම මාර්ග මෝටර් ග්‍රේඩර් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**5.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

මොනරාගල, කුඹුක්කන පිහිටි සුභාග්‍යා විද්‍යාලයේ(ශ්‍රවණ/දෘෂ්ඨී ඌනතා සහිත ළමුන් සිටින විදුහල) විදුහල්පතිතුමා විසින් කරනු ලබන ඉල්ලීමට අනුව, දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එම විදුහල ඉදිරිපිට ඇති විදුලි කණුව සඳහා සහ පාසලේ කෑම ශාලාව ආශ්‍රිත ප්‍රදේශයට ආලෝක ධාරිතාව වැඩි විදුලි බුබුළු 02 ක් සවි කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමට අනුව විදුලි ධාරිතාවය වැඩි විදුලි බුබුළු 02 ක් මෙම විද්‍යාලය වෙනුවෙන් ලබාදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06.ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.01.01 දින සිට 2021.01.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය යෝජනා කරන ලද අතර, එම යෝජනාව රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම - නැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්, සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 8.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.උපුල් මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව හුලංදාව දකුණ ප්‍රදේශයේ ජීවත් වන මෙම කාර්යාලයේ සේවය කරන නිලධාරි මහත්මියකගේ මව මිය යාම හේතුවෙන් ගමන් කිරිමටවත් අපහසුව තිබූ එම නිවසට යන මාර්ගය ගරු සභාපතිතුමා, අදාළ නිවසට සහභාගී වූ අවස්ථාවේ එය අවබෝධ වීම මත ක්ෂණිකව ක්‍රියාත්මක වී එම මාර්ගය කපා සකස් කර දීම සම්බන්ධව ස්තුතිය පුද කර සිටින බවත් ඒ වගේ ම තවත් එවැනිම මාර්ග කිහිපයක් ම තම කොටඨාසයේ ඇති බැවින් එම මාර්ග ටිකද කපා සකස්කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා වසංගතය ඉතාමත් අවධානම් මට්ටමක පවතින අතර, ජනතාවට ලබාදී ඇති සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් හරියාකාරව පිළිපදිනවා නම් මෙම වෛරසය බෝවීම පාලනය කර ගත හැකි අතර, මොනරාගල ප්‍රදේශයේ ආසාධිතයන් හමුවන සෑම අවස්ථාවකදීම මොනරාගල ප්‍රාදේශීය සභාව මෙන්ම ප්‍රදේශයේ සෞඛ්‍ය අංශයේ නිලධාරින් තම ජීවිතයට පවා අවධානමක් ගෙන ඉතාමත් කැපවීමෙන් කටයුතු කරමින් තව කෙනකුට බෝවීමට ඇති ඉඩ කඩ සීමා කරමින් දැවැන්ත මෙහෙවරක යෙදමින් කටයුතු කිරිම සම්බන්ධයෙන් බෙහෙවින් ම ස්තුතිවන්ත වන බවත්, ඒවගේ ම පසුගිය මාසය වන විට විශාල පවුල් රාශියක් ප්‍රදේශයේ නිරෝධායනයට ලක් වූ අතර, රටේ සංවර්ධනයට වෙන් කර තිබූ මුදල්වලින් විශාල මුදලක් වැය කර රජය විසින් එම නිරෝධායනයට ලක් වූ පවුල් වෙත ලබා දෙනු ලබන රු.10,000/= වටිනා බඩු මල්ලක් ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ග්‍රාම නිලධාරිවරුන් විසින් ඒ කටයුතු ඉතාමත් සාර්ථකව ඉටු කළ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, මුළු රටම වසා තබන්නේ නැතිව මෙය පාලනය කිරිමට කටයුතු කරන රටේ සියළුම දේශපාලන නායකයින් ඇතුළු සමස්ථ

සෞඛ්‍ය අංශයට බෙහෙවින් ස්තූතිය පුදකර සිටින බවත්, ඉතාමත් කඨිනමින් මෙම වෛරසය තුරන් වී රටට සෞභාග්‍ය උදාවේවා යන්න ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- අතුරු මාර්ග කැපීමේදී ගමේ ජනතාවගේ ද සහයෝගය ලබාදිය යුතු අතර, එවැනි මාර්ගවල ප්‍රදේශවාසීන් විසින් ගස්වල අතු කපා සහයෝගය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම කොරෝනා මර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රදේශයේ PHI මහත්වරුන් ඇතුළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් විසින් සිදු කරනු ලබන කැපවීම විස්තර කිරිමට වචනවත් නැති තරම් වන අතර, ඔවුන් වැනි දරුවන් බිහිකළ දෙමාපියන්ට පවා ස්තූතිය පුද කළ යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, ප්‍රාදේශීය සභාවක් වශයෙන්ද මෙම කටයුතු වෙනුවෙන් අදාළ සියළු ස්ථානවල විෂබීජහරණ කටයුතු ද PHI මහත්වරුන්ට ඉන්ධන ලබාදීමේ කටයුතු ද, පැය 24 පුරාම ප්‍රාදේශීය සභා සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවය ලබාදීමේ කටයුතු ආදි මේ සියළු කටයුතු සාර්ථක කර ගැනීමට උපරිම සහයෝගය අප විසින් ලබා දෙන බව ද ප්‍රකාශ කර සිටින ලදී.

## 8.2 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන අධිකාරියටත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියටත් අයත් බොහෝ මාර්ග කාපට් කර ඇති අතර, එසේ වැඩ නිම කර ඇති සෙත්සිරි මාවතෙත් ,ප්‍රගති මාවතේත් ප්‍රධාන කාපට් මාර්ගයට සම්බන්ධ වන ස්ථානවල කාණුවලට යොදා ඇති කොන්ක්‍රිට් තහඩු ගැලවී ඉතා අනතුරුදායකව පවතින අතර, මාර්ග සකස් කිරිමේ කටයුතුවල විධිමත් භාවයක් ඇති වීමට නම් එම අඩුපාඩු සකස් විය යුතු බවත්, ඒ වගේ ම මෙම ආයතනට වලට අයත් කාපට් මාර්ගවල දෙපස දමා ඇති ග්‍රැවල් සෝදා පාළුවට ලක්වී විශාල කඩතොළුවීම් හා වලවල් හැරී අනාරක්ෂිත තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම මාර්ග වල කිසිම නඩත්තු කිරිමක් නොපෙන්වන අතර, මෙම පසුවිපරම් කටයුතු ඔවුන්ගේ සැලසුම්වලට ඇතුළත් කරමින් එම පසු විපරම් කටයුතු සිදු කරන ලෙසට අදාළ ආයතනවලට දන්වා යැවීම සුදුසු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒවගේ ම මහානාම ජාතික පාසල අසල කනත්ත මාර්ගයේ පිහිණුම් තටාකය අසල ඇති ඉපිල් ගසක විශාල අත්තක් කැඩීමට ආසන්නව බිමට පහත්ව ඇති අතර, එය කඩා වැටීම සිදුවුවහොත් විශාල හානියක් සිදුවිය හැකි අතර, අප කිහිප දෙනකු විසින් ද, විදුලි බල මණ්ඩලයෙන් ද එය කපා ඉවත් කිරිමට උත්සාහ කළ ද විශාල උසක පැවතීම මත එය සිදු කිරිමට නොහැකි වූ බැවින්, ඉතා කඩිනමින් මේ සඳහා සුදුසු විසඳුමක් ගැනීමට සිදුවන බැවින්, ඒ සඳහා වග කිව යුතු පාර්ශවයන් දැනුවත් කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම ප්‍රදේශයේ කොරෝනා වසංගත පාලන කටයුතු වෙනුවෙන් ප්‍රාදේශිය සභාවත්, PHI මහත්වරුන් ඇතුළුව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තිළිණ වෙල්ලාලගේ මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ද, මාධ්‍යවේදී මහතුන් විසින්ද දැවැන්ත කාර්ය භාරයක් සිදු කරන අතර, විශේෂයෙන් ම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන් දිවා රෑ දෙකේදී ම සිදු කරනු ලබන මහඟු මෙහෙවර හා ඒවා අධීක්ෂණ කටයුතු කරනු ලබන නිලධාරින් ද ගරු සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු පිරිස විසින් සිදු කරනු ලබන කැප කිරිම් හා මහ පෙන්වීම් සඳහා විශේෂ ස්තූතිය හා

ගෞරවය පුදකර සිටින බවත්, එමෙන් ම පොලිස් නිලධාරින් ද දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාත් මේ සඳහා සිදු කරනු ලබන විශාල මෙහෙවර වෙනුවෙන් ප්‍රාදේශීය සභාව මගින් ස්තුතිය හා ගෞරවය පුද කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

<u>**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**</u>

- ඇත්තෙන් ම ආසාධිතයින් හමුවන ස්ථානයන් මාධ්‍යෝවේදින්ගේ මැදිහත් වීම මත මාධ්‍ය හරහා දැනුම් දීම තුළ ජනතාව ක්ෂණිකව දැනුවත්වී ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම තුළ ද මෙය ව්‍යාප්ත වීම පාලනයට මහගු පිටුවහලක් වී ඇති අතර, මේ වන විට ජනතාව ද බොහෝ සෙයින් සෞඛාරක්ෂිත ක්‍රමවේදයන්වල ට යටත්ව කටයුතු කරන බවක් පෙනී යන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම මාර්ග සංවර්ධන අධිකාරියටත්, පළාත් මාර්ග දෙපාර්තමේන්තුවටත් අදාළ මාර්ගවල අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙනුත් පිහිනුම් තටාකය අසල එම අත්ත කපා ඉවත්කිරීමටත් අදාල ආයතන වලට දන්වා යැවීමට කටයුතු කරමු කියා ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව 2021.01.26 වන දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව පැවැත්වුණු අතර, අප ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් මෙය පැවැත්වීම සම්බන්ධව දැනුවත් නොකිරිම මත එම අවස්ථාවට සහභාගී වී නොමැති අතර, මේ සඳහා සහභාගී වීම අපි හැමෝගෙම අවශ්‍යතාවයක් වන අතර, මින් ඉදිරියට එසේ නොවීමට වග බලා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම අනවසර වෙළඳසැල් ඉවත් කිරිම සම්බන්ධව ගරු සභාපතිතුමා ඇතුළු පිරිසට ස්තුතිය පුද කර සිටින බවත්, නගර අලංකරණ කටයුතුවලට බාධාවක්ව පැවති මෙවැනි ක්‍රමවත් භාවයක් නොමැතිව පැවති සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරිම සුදුසු ක්‍රියාවක් වන අතර, මෙමගින් ඉදිරියේදී හෝ අනවසර ඉදිකිරීම් ඇති නොකිරිමට ජනතාව අවබොධ කර ගනියි යන්නත් කෙසේ වෙතත් අහිංසක මිනිසුන්ට වෙළඳාම් සිදු කර ගැනීමට ප්‍රාදේශීය සභාව මගින් නිශ්චිත ස්ථානයක් වෙන් කරදී විධිමත් වෙළඳ කුටි ඉදිකරදී විනයානුකූලව ඒ සඳහා අවස්ථාව ලබාදීම ඉතා වටිනා ක්‍රමවේදයක් වන අතර, එවැනි දේවල් මගින් ජනතාවගේ ප්‍රශංසාවට ලක් විය හැකි බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම කෝවිඩ් වසංගතය හේතු කොට ගෙන පසුගිය දිනවල නිරෝධායනයට ලක් වූ නිවාස වෙනුවෙන් රු.10000/= ක් වටිනා බඩු මල්ලක් ලබාදීම ඉතාමත් අගය කළ යුතු ක්‍රියාවක් වන අතර, නමුත් මේ දිනවල ප්‍රදේශයේ නිරෝධායනයට ලක්වූ පවුල් කිහිපයකටම එම බඩු මල්ල අතපසු වීමක් මගින් හෝ ලබා දීමට නොහැකි වී ඇති බවට තමන්ට දැන ගැනීමට හැකිවූ අතර, එසේ වීම සාධාරණ නොවන බැවින්, සහ එම නිරෝධායන කාල සීමාව තුළ ම අදාළ සහනාධාර ලැබිය යුතු බැවින්, ඒ සම්බන්ධව වග කිව යුතු සියළුම පාර්ශවයන් අවධානය යොමු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම I ROAD ව්‍යාපෘතිය මගින් බොහෝ මාර්ග මේ වන විට කාපට් කර අවසන් කරමින් පවතින අතර, බුත්සරණපිටිය හංදියෙන් එන කුකුරුමංගොඩ මාර්ගය ඉතා හොඳ මට්ටමින් සකස් කර තිබුණද එහි බෝක්කුවක් සකස් කර නොමැති අතර, එය සකස් කිරීම තුළ බොහෝ වාහනවලට සිරිගල ප්‍රධාන මාර්ගයට ඉක්මනින් ළඟා විය හැකි බැවින්, මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දී අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ප්‍රදේශයේ කොරෝනා වසංගතය බෝවීම පාලනය කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමන් ඇතුළු පිරිස, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තිළිණ වෙල්ලාලගේ මහතා ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්, මාධ්‍යවේදී මහත්වරුන් ගනු ලබන දැවැන්ත උත්සාහයේ ප්‍රතිඵල ලැබී ඇති අතර, මේ සියළු දෙනාටම ගෞරවය හා ස්තුතිය පුද කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

VI. පසුගිය දිනවල කාගේ හෝ මැදිහත්වීමක් අනුව ව්‍යාපෘතියක් හරහා රැකියා ලබාදීමේ පදනම මත සිදු කර ඇති කැඳවීම් වලට අනුව ගොස් ඇති එම රැකියා අපේක්ෂකයින්ගෙන් යම් මුදලක් එකතු කර ඇති බවට තමාට තොරතුරු ලැබුණු අතර, එසේ එම මුදල ලබා දීමට නොහැකි අය ආපසු හැරී පැමිණ ඇති බැවින්, ඒ සම්බන්ධව සොයා බලන්න කියාත් ඒ වගේ ම රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා සිටි කාලයේ එතුමාගේ මැදිහත් වීම මත ලබාගත් විශාල පුටු ප්‍රමාණයක් හා කැනපි ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තවමත් ඇති බැවින්, සියළු කොට්ඨාස නියෝජනය වන පරිදි සමිතිවලට හෝ ඒවා ලබාදීමට කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් ඉදිරි අනාගතය ලෙඩ රෝග වලින් තොර නිදුක් නිරෝගීමත් ජීවිත ගත කරන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- ඇත්තෙන් ම ආසාධිතයින් හමුවන ස්ථානයන් හා අදාල තොරතුරු මාධ්‍යවේදින්ගේ මැදිහත් වීම මත මාධ්‍ය හරහා දැනුම් දීම තුළ ජනතාව ක්ෂණිකව දැනුවත්වී ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම තුළ ද මෙය ව්‍යාප්ත වීම පාලනයට මහගු පිටුවහලක් වී ඇති අතර, මේ වන විට ජනතාව ද බොහෝ සෙයින් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්වලට යටත්ව කටයුතු කරන බව පෙනී යන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- හුලංදාව හංදියේ සිට සිරිගල රෝහල් හංදිය දක්වා රජයේ ආයතන ඉදිරිපිට ඇති සියළුම අනවසර වෙළඳසැල් ඉවත් කිරීමට කටයුතු කර ගෙන යන අතර, විවිධ දෝෂාරෝපනයන් පැමිණියත් නගරයේ ක්‍රමවත් භාවය වෙනුවෙන් මින් ඉදිරියට අනවසර වෙළඳසැල් පවත්වා ගෙන යාමට ඉඩ නොතබන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලද අතර, මේ අයගෙන් බොහෝ දෙනෙකුට විකල්ප වෙනත් ස්ථානයන් තමන් ලබාදුන් බවත් ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම පසුගිය දිනවල එක දිගටම ප්‍රදේශයේ පොකුරක් වගේ පවුල් රාශියක් ම නිරෝධායනයට ලක්වූ බැවින් සහන බඩු මළු බෙදා දීමේදී ග්‍රාම සේවක නිලධාරින්, PHI මහත්වරුන් යම් යම් අපහසුතාවයන්ට පත් වී ඇති අතර, නමුත් කිසිම කෙනකුට එයින්

අසාධාරණයක් නොවෙන ආකාරයට කටයුතු කිරිමට ඔවුන් දැඩි වෙහෙසක් ගත් බවත්, ප්‍රාදේශිය සභා වාහන ද මෙම බඩු මළු බෙදා දීමේ කටයුතු වෙනුවෙන් යෙදවූ අතර නොලැබුණු අයට ඉදිරි දිනවලදී ඒවා ලබා දීමට කටයුතු කරයි යන්න ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒවගේ ම I Road ව්‍යාපෘතිය මගින් මාර්ග සකස් කිරීමේදී තව කාලයක් පවතින ඔවුන් ගැරන්ටි (තහවුරු) කර ඇති පාලම් බෝක්කු නැවත සංවර්ධනය නොකිරීමට හේතුව එය බවත්, නමුත් මාර්ග සංවර්ධනයේදී එය අඩු පාඩුවක් බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මේ වන විට නැවත නිදැල්ලේ හැසිරෙන ගවයින් සහ එළුවන්ගේ වැඩිවීමක් පවතින අතර, මේ හේතුවෙන් පසුගිය දිනවලද රිය අනතුරු දෙකක් පමණ සිදුවූ අතර, මේ සම්බන්ධව අවධානය යොමු කර ප්‍රාදේශීය සභාව විසින් කළින් සිදු කළ වැඩපිළිවෙල නැවත ක්‍රියාත්මක කර හෝ ඊට අදාල සුදුසු වැඩපිළිලෙක් අනුගමනය කළ යුතු බවට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම නක්කල හංදියේ ජංගම මාළු වෙළඳුන්ගෙන් දෛනිකව මුදල් අය කිරිම සඳහා සභාවේ අප විසින් ගත් සභා තීරණයකට අනුව කෙනකු යොදවා ඇති අතර, මෙම ස්ථානයට පැමිණෙන වෙළඳුන්ගෙන් බොහෝ දෙනෙක් මෙම කුළි මුදල් ලබාදීම පාඩුවක් යැයි සිතා පුද්ගලික ඉඩම්වලදී තම වෙළඳාම් කටයුතු සිදු කිරිමට පුරුදු වී සිටින අතර, මේ සම්බන්ධයෙන් නැවත තීරණයක් ගැනීමට සිදුවන බැවින්,මෙම ස්ථානයේ මාර්ගය දෙපස සිටින වෙළඳුන්ගෙන් සුපුරුදු පරිදි මුදල් අය කර ගැනීමටත්, පුද්ගලික ඉඩම්වල සිටිමින් වෙළඳාම් කරන වෙළඳුන්ගෙන් වාර්ෂිකව බලපත්‍රයක් ලබාදී මුදල් අය කර ගැනීම සුදුසු බැවින්, ඒ සඳහා ද අවධානය යොමු කර පියවරක් ගන්නා ලෙසට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම භයානක තත්ත්වයක් ගෙන ඇති කොරෝනා වසංගතය බල ප්‍රදේශයේ පැතිර යාමේ අවධානමක් පවතින මොහොතක ගරු සභාපතිතුමා ඇතුළු සභාවේ සියළුම සේවක පිරිසත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමන් ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් කරන්නාවූ මෙහෙවරට හද පිරි ප්‍රශංසාව පුද කර සිටින බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රිතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නිදැල්ලේ හැසිරෙන ගවයින් සම්බන්ධව නැවත තීරණයක් ගත යුතු බැවින්, මීට පෙර ගත් සභා තීරණය නැවත ක්‍රියාත්මක කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලද අතර ඒ සඳහා එම වැඩපිළිවෙල නැවත ක්‍රියාත්මක කරවීමට කටයුතු කරමු කියාද ප්‍රකාශ කර සිටින ලදි.

- ඒ වගේ ම නක්කල හංදියේ මාළු වෙළඳසැල් සම්බන්ධයේදී ප්‍රධාන මාර්ගයේ සිට අඩි 50 ක් ඉඩ තබා යම්කිසි ඉඩමක වෙළඳාම් කටයුත්තක් සිදු කරනවා නම් එවැනි වෙළඳාම් වෙනුවෙන් අපට කළ හැක්කේ වාර්ෂික බලපත්‍රයක් ලබාදීම පමණක් වන අතර, එසේ වෙළඳාම් සිදු කරන

වෙළඳුන් අනිවාර්යයෙන් ම ප්‍රාදේශිය සභාවේ වාර්ෂික බලපත්‍ර ලබා ගත යුතු අතර, ඒ අයගෙන් දෛනික කුළී අය කර ගැනීමට නොහැකි බව ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ග්‍රාම සේවා වසම් 4 ක් සහිත විශාල ප්‍රදේශයක් වන බෝහිටිය කොට්ඨාසයේ ඇති අතුරු මාර්ග බොහෝමයකින් තවත් අතුරු මාර්ග 10 ක් පමණ කැපීමට ඇති බැවින්, එම මාර්ගයන් භාවිතා කරන ජනතාව නිතරම අපහසුතාවයන්ට මුහුණදෙන බැවින්, එම ඉතිරි මාර්ග ටික හැකි අයුරින් හෝ කපා සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින ලදී.

II. ඒ වගේ ම මේ දිනවල ප්‍රදේශයේ අදාල ප්‍රදේශවල විදුලි පද්ධතිය තෙකලා විදුලිය බවට පරිවර්ථනය කරමින් පැවතියද අළුත්වත්ත, කොලොන්වින්න, ගල්ගෙඩියාව යන ප්‍රදේශවල අඩු විදුලි ධාරිතාවය සම්බන්ධව පවතින ගැටළුවට තවමත් විසඳුමක් නොමැති අතර, මේ වන විට අලියාවත්ත, කවුඩාව ප්‍රදේශවල විදුලිය සකස් කරමින් පැවතියද දැන ගැනීමට ලැබුණු තොරතුරුවලට අනුව අළුත්වත්ත, කොලොන්වින්න යන ප්‍රදේශවල විදුලිය සකස් නොකරන බවට දැන ගැනීමට හැකිවූ බැවින් එම අත්‍යාවශ්‍ය ප්‍රදේශවලටත් කෙසේ හෝ මේ හරහා විදුලිය ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම ඉංග්‍රිසි ඩිප්ලෝමාව හදාරා මාස 06 ක පාසල්වල පුහුණුව ලබා මෙතෙක් රැකියා අපේක්ෂාවෙන් 158 කට ආසන්න දරුවන් ප්‍රමාණයක් ඌව පළාතේ සිටින අතර, එයින් මොනරාගල බල ප්‍රදේශයේ 20 කට ආසන්නව සිටින අතර පසු ගිය දිනක අතිගරු ජනාධිපතිතුමන් ගම සමග පිළිසඳරක් වැඩසටහනට සහභාගී වූ අවස්ථාවේ දී රැකියා අපේක්ෂිත එම දරුවන් විසින් මෙම ගැටළුව ඉදිරිපත් කර සිටිය ද ඒ මොහොතේ එතුමන්ගෙන් සාර්ථක පිළිතුරක් නොලැබුණු අතර, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් නායක කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන් සමඟ සාකච්ඡා කර මෙම දරුවන්ට සාධාරණත්වයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- JCB යන්ත්‍රය විශාල වැඩ කොටසක් සිදු කරන අතර නිතරම එහි අලුත් වැඩියා කටයුතු යෙදෙන අතර, මේ වන විටත් මෙම යන්ත්‍රයේ දෝෂයක් නිසාවෙන් ගරාජ් එකේ නතර කර ඇති බවත්, එය සකස් කර ගැනීමෙන් අනතුරුව හැකි ඉක්මනින් එම මාර්ග ටික කපා දෙන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම මේ වන විට සෑම ප්‍රදේශයකම තෙකලා විදුලි පද්ධතිය සකස් කර ගෙන යන අතර, බෝහිටිය ප්‍රදේශයේත් විදුලිය සකස් කිරිමට නියමිත බැවින්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ

කමිටුවේත් සාකච්ඡා කර අවශ්‍ය ප්‍රදේශවලට විදුලිය සකස් කර ගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරින්ට රැකියා ලබා දීමේදී දුෂ්කර ප්‍රදේශවල නම් ඇතුලත් කරමින් ඉල්ලුම් කළ අයට මූලික අධියරයේදීම අදාල රැකියා අවස්ථා හිමි වූ අතර ඉතිරි අයට ද ඉදිරි දිනවලදී අදාළ රැකියා ලැබෙයි යන්නත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සනත් ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් ක්‍රිශාන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ සිරිගල ප්‍රදාන මාර්ගයේ සිට මාගන්දනමුල්ල මාර්ගයට පිවිසෙන ස්ථානයේද කොන්ක්‍රීට් ප්ලේට් සකස් කළ යුතුව පවතින අතර, ඒ වගේ ම 6 වන පටුමඟ හි ද කාපට් අතුරා සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර තිබූ බෝක්කුවක් ගලවා ඉවත් කර ඇති අතර, එම බෝක්කුවට කුමක් වූවා ද යන්න තොරතුරක්වත් නොමැති බැවින්, ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම අතුල මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා වගේ ප්‍රාදේශිය සභා සභිකවරුන්ට කතා කිරිමට ඇති එකම අවස්ථාව වන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව ඉතාමත් වැදගත් වන බැවින් පසුගිය මස පැවති එම කමිටුව සම්බන්ධයෙන් අප දැනුවත් නොකිරිම සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කර සිටින බවත්, ඉදිරියට එසේ නොවීමට කටයුතු කරන්න කියාත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- පසුගිය දිනවල සභාවේ නිලධාරිතුමියකට කොරෝනා රෝගය සැදීමත් සමග කාර්යාලයේ බොහෝ පිරිසක් නිරෝධායනයට ලක්වූ අතර, එම දිනවලදි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව පැවැත්වෙන බවට තමන් වෙත ලිපියක් පැමිණිය ද ඒ පැවති කලබලකාරි තත්ත්වය මත මන්ත්‍රීවරුන් දැනුවත් කිරිමට නොහැකි වීම සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කර සිටින බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.7ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රදීප් විතානගේ මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව 2021 වර්ෂයට සභාව සතු දේපල සියල්ල ටෙන්ඩර් කිරිමට කටයුතු කර තිබූ අතර, මේ වන විට මේ සියළු කඩ කාමර ටෙන්ඩර් මගින් බඳු දී අවසන් ද යන්න ගරු මන්ත්‍රීතුමා විමසිම් කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30ස් අවුරුද්දකට යටත්ව බදු දීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය පසුගිය සතිය වන විට ලබා ගැනීමට හැකිවූ අතර, ලබන සතිය තුළ ඊට අදාළ සියලුම ගිවිසුම් අත්සන් කරන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.30 ට පමණ අවසන් කරන ලදී.

2021.02.12 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ..........................................................................................................යෝජනාවෙන් සහ................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,

ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

**➢ ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.